## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - 2012

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව, සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්

පහත සඳහන් උසස් ගිණුම්කරණ පරිචයන් අනුගමනය කර නොතිබුණි.

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත්, තවදුරටත් ප්‍රයෝජනයට ගෙන තිබුණු පිරිවැය රු.22,266,722 ක් වූ විෂයයන් 13 ක වත්කම් ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට එරෙහිව රු.500,000 ක වන්දි ඉල්ලා අධිකරණයේ ගොනු කර තිබූ නඩුව සම්බන්ධයෙන් වූ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නන්දන මාවත පරිශ්‍රයේ ඉදිකරන ලද 2012 වර්ෂය අවසන් වන විට වැඩ නිම වී තිබූ වටිනාකම රු.698,098 ක් වූ වාහන ගරාජය, ස්ථාවර වත්කම් ගිණුමට මාරුකර නොතිබීම හේතුවෙන් වර්ෂය අවසානයේ කෙරෙගෙනයන වැඩ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා අදාල වත්කම් ගිණුම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයට අයත් වෑන් රථයක් විකිණීමෙන් ලද රු.2,359,975 ක් ප්‍රාග්ධන සංචිත ගිණුමට මාරු කර, වෑන් රථය විකුණා ලද මුදලින් රු.1,995,000 ක් වැය කර ලොරි රථයක් මිලදී ගෙන තිබූ අතර එම වටිනාකම ප්‍රාග්ධන සංචිත ගිණුමෙන් ඉවත්කර නොතිබීම හේතුවෙන් රු.1,995,000 කින් ප්‍රාග්ධන සංචිත ගිණුම වැඩියෙන් දක්වා තිබුණි. ලොරි රථය මිලදිගෙන ඉතිරි වූ රු.364,975 ක මුදල 2011 මැයි 06 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක PF/FS/A/Vehi/2011 දරන චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය විසින් 2013 වර්ෂයේ ගෙවීම් කර තිබුණු සමාලෝචිත වර්ෂයට අදාල අළුත්වැඩියා වියදම් රු.94,765 ක් මූල්‍ය ප්‍රකාශනවල උපචිත වියදම් යටතේ දක්වා නොතිබුණි.

(ඈ) කාර්යාල උපකරණ ගිණුම 2012 වර්ෂයේ රු.512,402 ක් ක්ෂය කළයුතු වුවද, මූල්‍ය ප්‍රකාශන වල රු.702,069 ක් ක්ෂය ලෙස දක්වා තිබීම නිසා රු.189,667 කින් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය ගිණුම වැඩියෙන්ද, ස්ථාවර වත්කම් ගිණුම් හා වාර්ෂික ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඉ) පර්යේෂණ කාර්යයන්ට අදාල නොවන රු.1,243,560 ක් වූ වියදම් වර්ග 04 ක් පර්යේෂණ වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්.

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | උපලේඛනයට අනුව ශුද්ධ වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) ගොඩනැගිලි | 164,662,606 | (i) සමීක්ෂණ මණ්ඩල වාර්තා<br>(ii) විස්තරාත්මක උපලේඛනය |
| (ආ) කාර්යාල උපකරණ | 2,334,252 | විස්තරාත්මක උපලේඛන |
| (ඇ) ඉගැන්වීමේ උපකරණ | 815,296 | |
| (ඈ) යන්ත්‍ර හා පිරියත | 680,375 | |
| (ඉ) මෙවලම් උපකරණ | 1,335,550 | |
| (ඊ) ලී බඩු හා උපකරණ | 9,461,991 | |
| (උ) පරිගණක දෘඩාංග | 5,783,352 | (i) විස්තරාත්මක උපලේඛන<br>(ii) පරිගණක ස්ථාවර වත්කම් ලේඛනය |
| (ඌ) පරිගණක මෘදුකාංග | 81,414 | |

1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මු.රෙ. 104 | විශ්වවිද්‍යාලයට අයත් වාහන 02 ක් අවස්ථා 03 කදී අනතුරුවලට භාජනය වී රු.290,164 ක අලාභය සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) චක්‍රලේඛ විධිවිධාන | |
| 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ ප්‍රකාරව උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් තමාට හිමි මාසික ඉන්ධන සීමාව වූ ලීටර් 225 ක් ඉක්මවා සමාලෝචිත වර්ෂය තුළදී ලීටර් 1016 ක් වෙනුවෙන් රු.169,123 ක් වටිනා ඉන්ධන ලබාගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 25,060,055 ක ඌනතාවයක් වු අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.14,853,726 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහිම රු. 10,206,329 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.25,060,055 ක ඌනතාවයක් වූ අතර පුනරාවර්තන වියදම් දැරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු රු.83,512,127 ක මුදලින්, විශ්වවිද්‍යාලයේ මුදල් පිටතට ගලා යන වර්ෂයේ වියදම් දැරීමෙන් පසුව රු.6,217,326 ක ඌනතාවයක් විය. සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හරින ලද ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය රු.19,971,415 ක්ද, පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය රු.1,206,694 ක්ද, වශයෙන් විශ්වවිද්‍යාලයේ මුදල් පිටතට ගලා නොයන වියදම් එකතුව රු.21,178,109 ක් සමාලෝචිත වර්ෂයේ ඌනතාවයට හේතු වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ මුදල් පිටතට ගලා නොයන වියදම් රු.1,292,367 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂයේ ඌනතාවය වැඩි වීමට හේතු වී තිබුණි.

2.3 ආයතනයට එරෙහිව නෛතික සිද්ධි

2011 ජුනි 09 වන දින විශ්වවිද්‍යාලයට අයත් වාහනයකින් බාහිර පාර්ශවයකට සිදු වූ අනතුරක් හේතුවෙන් රු.500,000 ක වන්දි ඉල්ලා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට එරෙහිව අධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

2.4 වියදම්වල අසාමාන්‍ය වැඩි වීම

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී වැය විෂයන් 07 ක වැය දැරීමේදී අසාමාන්‍ය වැඩිවීම් පැවතුණි. විස්තර පහත දැක්වේ.

| වැය විෂයය විස්තර | 2012 සත්‍ය වියදම | 2011 සත්‍ය වියදම | වැඩිවීම | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල පාරිභෝජන ද්‍රව්‍ය | 1,358,901 | 710,278 | 648,623 | 91 |
| ඉන්ධන හා තෙල් | 1,480,777 | 750,802 | 729,975 | 97 |
| උපකරණ හා වාහනවල සුළු අළුත්වැඩියා | 1,692,137 | 862,960 | 829,177 | 96 |
| ගොඩනැගිලි නඩත්තු | 473,736 | 147,126 | 326,610 | 221 |
| උපකරණ නඩත්තු | 662,225 | 404,304 | 257,921 | 64 |
| මුද්‍රණ හා දැන්වීම් කටයුතු | 1,071,459 | 361,738 | 709,721 | 196 |
| උද්‍යාන නඩත්තු සේවා | 4,113,867 | 2,808,714 | 1,305,153 | 46 |
| | 10,853,102 | 6,045,922 | 4,807,180 | |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2012 වර්ෂයේ පැවැත් වූ ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණයේ ආරම්භක දේශනය සඳහා පැමිණි ඇමරිකානු විශ්වවිද්‍යාලයක සේවයේ නියුතු කථිකාචාර්යවරයෙකුට ගුවන් ටිකට්පත් ගාස්තු වශයෙන් රු.169,614 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 385(1) ට පටහැනිව චෙක්පතක් මගින් ගෙවීම් නොකර ආචාර්යවරයාගේ පෞද්ගලික නමට රු.169,602 ක් මුදලින් ගෙවා තිබුණි.

(ආ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව යානාපත්‍ර මිලදී ගැනීම රාජ්‍ය බැංකු යටතේ පාලිත සමාගම් වන බී.ඕ.සී. ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හා පීපල්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් මගින් ඉටුකරවා ගතයුතු වුවද ඊට පටහැනිව මිල ගණන් කැඳවීමකින් තොරව පෞද්ගලික ආයතනයක මිල පදනම් කරගෙන රු.169,614 ක් යානාපත්‍ර ගාස්තු ගෙවා තිබුණු නමුත්, ඉහත චක්‍රලේඛය මගින් අනුමත ආයතනයක් වූ පීපල්ස් ට්‍රැවල්ස් පෞද්ගලික සමාගමේ ඊට අදාල මිල 156,700 ක් වුයෙන් විශ්වවිද්‍යාල අරමුදලට රු.12,914 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 264 (1) ප්‍රකාර ඉහත සඳහන් ගෙවීමට අදාල ගුවන් ටිකට්පත් උපපත්‍රිකා, ගුවන් ගමන් බලපත්‍රයේ පිටපතක් හෝ වෙනත් ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම

-------------------------------------

(i) ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල, ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව, ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුව අනුමත කරන ලද මිල ගණන් මත නිර්මාණ හා ඉදිකිරීමේ පදනමට ( Design and Build basis on the rates approved by the standing Technical Committee of the Ministry of Construction and Engineering Services ) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පැවරීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2008 ජුනි 17 දින අනුමත කර තිබුණි. ඒ අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ඉදිරිපත් කළ රු.83,338,055 ක ඇස්තමේන්තුව ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටුවට (Standing Technical Committee ) ඉදිරිපත් කර තිබුණු අතර එහිදී ඇස්තමේන්තුවෙහි මිල ගණන් (Rates) සංශෝධනය කොට රු.68,062,631 කට අනුමත කර තිබුණි. එහෙත් රු.83,338,055 ක් වූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ඇස්තමේන්තු මිලට කොන්ත්‍රාත්තුව පිරිනැමීම නිසා තාක්ෂණික ඇගයීම් කමිටුව අනුමත කළ මිලට වඩා රු.15,275,424 ක වැඩි මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ii) මෙම කොන්ත්‍රාත්තුව 2010 ජුනි 16 දින වැඩ නිම කර විශ්වවිද්‍යාලය වෙත භාරදී තිබූ අතර අවසන් බිල්පත් හැර රු.72,507,363 ක් අදාල ආයතනය වෙත ගෙවා තිබූණි. ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුව මෙම ඉදිකිරීම රු.68,062,631 කට සංශෝධනය කර අනුමත කර තිබූ බැවින් මේ දක්වා වැඩිපුර ගෙවා ඇති මුදල රු.4,444,732ක් විය.

(iii) කොන්ත්‍රාත්තුව 2010 ජුනි 16 දින අවසන් කර විශ්වවිද්‍යාලයට භාරදී තිබුණත් විගණිත දිනය වන 2013 මාර්තු 15 දින වන විටද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව වැඩ අවසන් කිරීමේ සහතික අදාල උපදේශක ආයතනය වෙතින් ලබාගෙන නොතිබුණි.

(ආ) භාෂා අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම.

භාෂා අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පහත සඳහන් කොන්දේසි වලට යටත්ව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පැවරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණී.
"රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුවේ සඳහන් මිළ ගණන් වල තරඟකාරී බව ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර අනුමත කරවාගෙන එම මිලට ඉංජිනේරු සංස්ථාවට පැවරීම"
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ඉදිකිරීම හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ පරිදි එම කොන්ත්‍රාත්තුව රු.213,000,000 කට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පැවරීමට අනුමැතිය ලබා දී තිබුණත් ඊට පටහැනිව රු.275,233,521 ක ඇස්තමේන්තු වටිනාකමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා තිබුණි.

(ii) ඇස්තමේන්තුවේ සඳහන් මූලික වැඩ (Preliminary) සඳහා වූ රු.1,996,850 ක ගෙවීම් තාක්ෂණික ඇගයීම් කමිටුව අනුමත කර නොතිබුණු අතර එම විෂයයන් ලාභාන්තිකය මඟින් අනාවරණය වන බව නිරීක්ෂණය කර තිබුණි. එහෙත් එම විෂයය සඳහා රු.213,833 ක් ගෙවීම් කර තිබුණි.

(iii) ඇස්තමේන්තු මිලට කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හා ඊට අදාල එකතු කිරීමේ අගය මත බදු රු.14,013,888 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්ගේ 2011 දෙසැම්බර් 19 දිනැති අංක 4/2/5/265 දරන ලිපිය ප්‍රකාර උපදේශක සේවා ගාස්තු (Consultancy fee) ගෙවිය යුතුව තිබුණේ ඉදිකිරීම් වැඩ හා පොදු වෙන්කිරීම් ( building works and Provisional Sum ) වලට අදාල මුදලින් සියයට 4 ක් පමණක් වුවද, මුළු ඇස්තමේන්තුවෙන් සියයට 4 ක් ලෙස උපදේශන ගාස්තු ගෙවීම හේතුවෙන් රු.78,131 ක් උපදේශක ගාස්තුද වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ජල සැපයුම් පද්ධතිය ඉදිකිරීම

ජල සැපයුම් පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ජල ගබඩා ටැංකිය, (Over hand tank) භූගත ජල ටැංකිය, (Sump) සහ පොම්පාගාරය (Pump house) ඉදිකිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා තිබූ අතර මේ සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කර තිබූ රු.11,868,561 ක ඇස්තමේන්තු වටිනාකමට තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පැවරීමට ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු සැකසීම, ඉදිකිරීම් සහ උපදේශක සේවා සැපයීම ඇතුළු සියළු කාර්යයන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදු කර තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ පහත සඳහන් පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 11 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 13 ක පුරප්පාඩු පැවතුණි.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| (i) | මහෝපාධ්‍යායයන් වහන්සේ | 01 | 01 | - |
| (ii) | මහාචාර්ය | 04 | 01 | 03 |
| (iii) | කථිකාචාර්ය | 29 | 26 | 03 |
| (iv) | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | 01 | - | 01 |
| (v) | තාවකාලික කථිකාචාර්ය | 05 | 02 | 03 |
| (vi) | පරිගණක උපදේශක | 01 | 01 | - |
| (vii) | ඉංග්‍රීසි උපදේශක | 02 | 02 | - |
| (viii) | බෞද්ධ උපදේශක | 01 | - | 01 |
| | | 44 | 33 | 11 |

(ආ) අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| (i) | විධායක | 11 | 07 | 04 |
| (ii) | විධායක නොවන | 32 | 27 | 05 |
| (iii) | සුළු සේවක | 27 | 23 | 04 |
| | | 70 | 57 | 13 |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 ප්‍රසම්පාදන සැලැස්ම

විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව වාර්ෂික අවශ්‍යතා කලින් නිශ්චය කර ඒ අනුව අවශ්‍ය ප්‍රමාණයන් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළයුතු වුවත් එසේ නොකර මිලදී ගත් අවස්ථා නිරීක්ෂණය විය.

4.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2012 මැයි 20 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණු අතර 2011 වර්ෂය වෙනුවෙන් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුව ඇත.

(අ) කොන්ත්‍රාත් පරිපාලනය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) මානව සම්පත් පාලනය

(ඈ) අයවැය පාලනය